කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
முகாமைத்துவ கணக்காய்வுத் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.

நிதி, திட்டமிடல் அமைச்சு
செயலகம், கொழும்பு 01.

Ministry of Finance and Planning
The Secretariat, Colombo 01.

මගේ අංකය / எனது இல / My No. DMA/ADM/2010-80

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2010.07.26

කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2010(5)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

විදේශාධාර හෝ දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය සඳහා උපදෙස්

රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව සහ අරපිරිමැස්මෙන් භාවිත කර, සංවර්ධන ව්‍යාපෘතීන් කලට වේලාවට ඵලදායී ලෙස අවසන් කිරීම ප්‍රධාන ගණන් දීමේ /ගණන් දීමේ නිලධාරීන් වෙත පැවරෙන වගකීම නිසි අයුරින් ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණනය සහය විය යුතු ආකාරය මු.රෙ. 133(1) අ ii හි පහත සඳහන් පරිදි දක්වා ඇත.

"දෙපාර්තමේන්තුවට නියම කෙරුණු හෝ දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සහ සැළසුම් සහ වැඩසටහන් සපුරාලීමෙහි ලා ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ගණන් දීමේ නිලධාරියාට සහ ප්‍රගති අන්වේශන කමිටුවට සහය වීම."

විශේෂයෙන් විදේශාධාර මුදල් කාර්යක්ෂම ලෙස උපයෝජනය නොවුන හොත් ව්‍යාපෘති වියදම් ඒකාබද්ධ අරමුදලට අමතර වැය බරක් වනු ඇත. මනා මූල්‍ය කළමනාකරණයක් සහ කාර්යක්ෂම කාර්යසාධනයක් මගින් මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර විගණනයට ඵලදායීව දායක විය හැකිය. ව්‍යාපෘති අභ්‍යන්තර විගණනයේ දී විශේෂ අවධානය යොමු විය යුතු කරුණු, ව්‍යාපෘති සම්බන්ධයෙන් වැදගත් කරුණු අඩංගු වන ලේඛණ , චක්‍රලේඛ උපදෙස් සහ ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය සඳහා මඟපෙන්වන ප්‍රශ්නාවලියන් හඳුන්වාදීම මෙම උපදෙස් සංග්‍රහයේ අරමුණ වේ. (අභ්‍යන්තර විගණන ප්‍රශ්නාවලිය ඇමුණුම් 1, 2 හා 3 ලෙස මෙයට යා කොට ඇත.)

2. ව්‍යාපෘති අභ්‍යන්තර විගණනයේ දී අවධානය යොමුවිය යුතු කරුණු

1. ව්‍යාපෘතිය, එකඟවන ලද වැඩ සැළැස්ම අනුව ක්‍රියාත්මක වන්නේ ද නැතහොත් ඊට එරෙහි ව කිසියම් ගැටළුකාර තත්ත්වයන් මතු වී තිබේද
2. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය සහ අනෙකුත් පහසුකම්වල ප්‍රමාණවත්භාවය
3. තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීමේ පාලන උපක්‍රමවල ප්‍රමාණවත්භාවය
4. උපදේශකවරුන්ගේ අධීක්ෂණය ඔවුන් වෙත පවරා ඇති වගකීම් වලට අනුකූලව සිදු වන්නේද යන්න තහවුරු කිරීමට යොදා ඇති පාලන උපක්‍රම
5. ව්‍යාපෘති ප්‍රසම්පාදනය රජයේ සහ ආධාර දෙනු ලබන ආයතනයන් හි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව සිදු වන්නේ ද යන්න තහවුරු කර ගැනීම
6. ආධාර දෙනු ලබන ආයතන සමඟ වූ එකඟත්වයන්ට සහ උපදෙස් මාලාවන් ට අනුකූලව අරමුදල් යොදා ගැනීම සහ බෙදා හැරීම සිදුවන්නේ ද යන්න තහවුරු කර ගැනීම
7. සිවිල් වැඩ ඉදිකිරීම් සහ උපකරණ, භාණ්ඩ සහ සේවාවන් ආදිය ස්ථාපිත කිරීම් පිළිගත් ප්‍රමිතීන් සහ කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව සිදු වී තිබේද යන්න සනාථ කර ගැනීමට යොදා ඇති පාලන උපක්‍රම වල ප්‍රමාණාත්මකභාවය තහවුරු කර ගැනීම.
8 අරමුදල් උපයෝජනය සහ මූල්‍ය පාලන පද්ධතියේ ප්‍රමාණවත්භාවය සහතික වීමට යොදා ඇති වැඩපිළිවෙල

කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: (9411) 2484543

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496

වෙබ් අඩවිය / இணையம் / Website: www. treasury .gov.lk

9. එකඟ වූ මූල්‍ය කළමනාකරණ ගිවිසුමෙහි කොන්දේසි සහ අනෙකුත් ගිවිසුම් වලට අනුකූලව කටයුතු කෙරෙන බවට සහතික වීම
10. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රජයේ සහතිකවීම් සහ බැඳීම් සඵල වන බවට සහතික වීම
11. ව්‍යාපෘතියේ අංශ සහ ඒකක අතර අරමුදල් නැවත බෙදා හැරීම් සහ අතිරේක අරමුදල් අවශ්‍යතා පැන නගින්නේද ආදී කරුණු සම්බන්ධ මූල්‍ය කළමනාකරණයේ විධිමත්භාවය
12. ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් වී අතිරේක වැඩ ඇති වන්නේ නම් ඒ සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රමවේදය
13. ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීමට කටයුතු කරන්නේ නම් ඒ සඳහා ඇති අවශ්‍යතාව තහවුරු කරගැනීම
14. ව්‍යාපෘතිය අවසන් කිරීමේ ක්‍රියාවලිය, ව්‍යාපෘති නිමැවුම් නඩත්තුව සඳහා යොදා ඇති ක්‍රියා මාර්ග, ව්‍යාපෘතිය සම්පූර්ණ කළ බවට සහතික නිකුත් කිරීම, රක්ෂණ සහ ඒ සම්බන්ධ ඉල්ලීම් නිදහස් කිරීම සහ වත්කම් පැවරීම ආදී ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා යොදා ඇති වැඩ පිළිවෙල

3. ව්‍යාපෘති අභ්‍යන්තර විගණනයේ දී අවධානය යොමු විය යුතු ලේඛන

3.1 ණය ගිවිසුම (Loan agreement)

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන ඇගයීමකින් පසු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය සම්බන්ධව විදේශාධාර දෙනු ලබන ආයතනය සහ ශ්‍රී ලංකා රජය ගිවිසුම් වලට එළඹෙන අතර, ණය ගිවිසුම ඉන් එක් ගිවිසුමක් වේ. ණය ගන්නා සහ ණය දෙන්නා නිර්වචනය කිරීම, ණය මුදල් ප්‍රමාණය සහ ව්‍යාපෘතියේ නම, ණය දෙන්නා සහ ණය ගන්නා අතර ඇතිවන බැඳීම්, ගිවිසුම් සහ සහතික වීම්, ව්‍යාපෘතියේ අරමුණු, ණය මූලිකාංග වර්ගීකරණයන් හා අයිතමයන්, මූල්‍යකරණ සැළැස්ම, ණය අරමුදල් භාවිතය සහ බෙදා හැරීමේ ක්‍රියා මාර්ග, ණය අරමුදල් සූදානම් කිරීම සහ ණය දෙන්නා විසින් සපයනු ලබන පහසුකම් වල සීමාවන්, ණය සක්‍රීය වීම සහ ව්‍යාපෘති කාල සීමාව, බලතල බෙදා හැරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ණය අරමුදල් මුදා හැරීම, ණය මුදල් ආපසු ගෙවීමේ ලේඛනය, ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය, උපමූල්‍යයන ගිවිසුම් අවශ්‍ය නම් ඒවා සහ ණය මුදල වසා දැමීම යන කරුණු මෙම ගිවිසුමට ඇතුළත් වේ.

3.2 ප්‍රදාන ගිවිසුම (Grant Agreement)

ව්‍යාපෘතිය සඳහා ප්‍රදාන වශයෙන් විදේශාධාර ලැබෙන විට ප්‍රදානය කරනු ලබන විදේශ ආයතනය සහ ශ්‍රී ලංකා රජය අතර ගිවිසුමක් අත්සන් කෙරෙයි. ප්‍රදානය දෙනු ලබන ආයතනයේ නම, සම්බන්ධීකරණ ඒජන්සිය, ආධාර ලබන්නා සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නන්ගේ නම්, ප්‍රදානයේ වටිනාකම, ව්‍යාපෘතියේ විෂය සීමාව සහ ප්‍රදානකරු සහ ප්‍රදානලාභියා අතර සහයෝගීතාව නියෝජනය සහ පරිපාලනය, ප්‍රදානකරු සහ ප්‍රදාන ලාභීන්ගේ දායකත්වය සහ බැඳීම්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, වාර්තා කිරීමේ අවශ්‍යතා, ව්‍යාපෘති ප්‍රසම්පාදන ඇගයීම, ගැටළු නිරාකරණය, ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීම හා ඊට අදාළ ආකෘති, මූල්‍ය සැළැස්ම යන කරුණු මෙම ගිවිසුමට ඇතුළත් වේ.

3.3 උප මූල්‍යයන ගිවිසුම් (Subsidiary Financing Agreement)

කිසියම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථා හෝ ව්‍යාපාර වලට විදේශාධාර ලබාදෙන අවස්ථාවන්හිදී රජය එම ආයතනය සමඟ පහත සඳහන් විධි විධාන ඇතුළත් උප මූල්‍යයන ගිවිසුමකට එළඹෙයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයට රජය ලබා ගන්නා ණය මත නැවත ණය දීමක් සිදු කෙරේ. රජය එම ණය ලබා ගන්නා ආයතනය නමින් ණය ගිණුමක් විවෘත කරනු ලබයි. මෙම ගිවිසුමට අනුව ණය ලබා ගන්නා ආයතනය විසින් ණය මුදලේ නිදහස් කරගත යුතු ශේෂය වෙනුවෙන් ගිවිසුමට අනුව නිශ්චය කර ගන්නා ලද පොලියක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. ප්‍රධාන ණය මුදල ද සහන කාල සීමාවක් දී ඇත්නම් ඊට පසුව ගිවිසුමට අනුව එළඹෙන ලද දිනයන් හි රජයට ආපසු ගෙවිය යුතුය. පොලිය හා මුදල් ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා ප්‍රමාද ගාස්තුවක් ද ගිවිසුමට අනුව ගෙවිය යුතුය. මීට අමතරව මෙම ගිවිසුමෙහි මූලික කොන්දේසි, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, ගිවිසුම ආරම්භ කරන දිනය හා අවසාන වන දිනය ආදී වැදගත් කරුණු ද ඇතුළත් වේ. උප මූල්‍යයන ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් අභ්‍යන්තර විගණනය සඳහා එම ගිවිසුම පිළිබඳ අවබෝධය වැදගත් වේ.

3.4 විදේශාධාර සපයනු ලබන ආයතන විසින් විටින් විට නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ සහ අත්පොත් (Guidelines and Manuals)

විදේශාධාර සපයනු ලබන ආයතන විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශයන්හි එක් එක් ආයතනයේ විදේශාධාර සැපයීම සම්බන්ධ ප්‍රතිපත්ති, උපදෙස්මාලා, භාවිතයන් සහ ක්‍රියා පිළිවෙත් පිළිබඳව ප්‍රකාශ වන අතර විදේශාධාර මුදල් ප්‍රවාහය සිදු කෙරෙන ආකාරය, ණය මුදල් මුදාහැරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය, ව්‍යාපෘති කාර්යය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය සහ මනා අභ්‍යන්තර පාලනය යන කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණයකට වැදගත් වන කරුණු අඩංගු වේ. තවද අරමුදල් නිදහස් කරගැනීම සඳහා අයදුම් කිරීමේ දී ආධාර වන සියලුම ලේඛන ඉදිරිපත් කිරීම වෙනුවට SOE (statement of expenditure)Procedure, Force account procedure , සහ SAW (simultaneous application for subloan approval and withdrawal) Procedure ආදී සරල කිරීමේ ක්‍රම සහ ඊට අවශ්‍ය ලේඛන සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලීන් සහ ඒ සඳහා තිබිය යුතු මනා ව්‍යාපෘති කළමනාකරණය වැනි පොදු කරුණු රැසක් එම මාර්ගෝපදේශයන් හි ඇතුළත් වන හෙයින් අභ්‍යන්තර විගණනයේ දී ව්‍යාපෘතියට අදාළ ණය දෙන ආයතන විසින් ප්‍රකාශිත මාර්ගෝපදේශ පිළිබඳ අවබෝධය වැදගත් වේ.

3.5 ව්‍යාපෘති ප්‍රසම්පාදනය (Project Procument)

ව්‍යාපෘති ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ව්‍යාපෘතියක කාර්යසාධනයට බෙහෙවින් බලපායි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 සහ ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය රජයේ ටෙන්ඩර් පර්පාටිය සම්බන්ධ සියලු චක්‍රලේඛ විධිවිධාන අභිබවා ක්‍රියාත්මක වෙයි. විදේශාධාර සපයනු ලබන ආයතන සමඟ සාකච්ඡා කොට යථෝක්ත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කර ඇති හෙයින්, මුදල් සැපයීමේ මූලාශ්‍ර නොසළකා මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සියලුම ප්‍රසම්පාදනයන් ට බලපාන බව එහි 1.3.2 වගන්තියෙහි දැක් වේ. තවද 1.3.3 වගන්තියට අනුව මුදල් සපයනු ලබන ආයතනය විසින්ම නිකුත් කොට ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළයුතු බවට එම ආයතනය විසින් නියම කරනු ලබන්නේ නම් හැකිතාක් දුරට එම ප්‍රසම්පාදන උපදෙස් ක්‍රියාත්මක කළයුතු බවත්, යම් හෙයකින් ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන සමඟ ගැටීමක් ඇති වන්නේ නම් ණය දෙනු ලබන ආයතනයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමය කළයුතු බවත් දැක් වේ. තවද විදේශ මුදල් සපයනු ලබන ව්‍යාපෘතියක දී මුදල් සපයනු ලබන ආයතනයේ එකඟත්වය ඇතිව විදේශීය කොන්ත්‍රාත්කරුවන්ට දේශීය කොන්ත්‍රාත් කරුවන් සමඟ සමාන කොන්දේසි යටතේ තරඟ කිරීමට අවස්ථාව ලබාදීම, දේශීය රාජ්‍ය ආයතන හෝ අනුමත සමිති සමාගම් වලට විශේෂ වරප්‍රසාද නොදීම සහ ICTAD ආයතනයේ ලියාපදිංචිය සැළකිල්ලට ගැනීම යන කරුණු සම්පූර්ණ වන්නේ නම් ජාතික වශයෙන් තරඟකාර් ලංසු කැඳවීමක් කළහැකි බවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.3 වගන්තියෙන් අවධාරණය කොට ඇත. මෙම විශේෂිත කරුණු වලට යටත් ව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ව්‍යාපෘති ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් බලාත්මක වන ප්‍රමුඛ විධිවිධානය වන හෙයින් ඒ පිළිබඳ අවබෝධය ද අභ්‍යන්තර විගණනයේ දී වැදගත් වේ.

3.6 ව්‍යාපෘති සේවක මණ්ඩල කළමනාකරණය (Project Staff Management)

ව්‍යාපෘති සේවක මණ්ඩල කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් කොන්දේසි වලට යටත් ව 2007.04.05 දිනැති අංක 33 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2007.12.30 දිනැති 33.1 දරණ සංශෝධිත කළමනාකරණ සේවා චක්‍රලේඛය බලපායි.

මෙම චක්‍රලේඛ අදාළ කර ගැනීමට නම්,

I. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඇගයීමට ලක්කරන ලදුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද විදේශ සම්පත් සහ කළමනාකරණ සේවා යන දෙපාර්තමේන්තුවල එකඟත්වය ඇතිව අරමුදල් සැපයීම, අයවැය ප්‍රතිපාදන සැළසීම සහ තනතුරු අනුමත කිරීම කරන ලද ව්‍යාපෘතියක් විය යුතුය.

ii. ව්‍යාපෘති කාල සීමාව වසර 2 ට වැඩිවිය යුතුය.

iii. ව්‍යාපෘතිය විදේශාධාර මඟින් ක්‍රියාත්මක කරනු ලබයි නම්,

(අ) විදේශාධාර ප්‍රමාණය ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තුවෙන් 50% ට වැඩි විය යුතුය.
(ආ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ශ්‍රී ලංකා රජය සමඟ ණයදෙනු ලබන ආයතන විසින් ගිවිසුමකට එළඹිය යුතු අතර ගිවිසුමෙහි ව්‍යාපෘතියට අනන්‍ය වූ නමක් ලබා දී තිබිය යුතුය.
(ඇ) ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 5.0 ට අඩු නොවිය යුතුය.

iv. ව්‍යාපෘතිය දේශීය අරමුදලින් ක්‍රියාත්මක කරනු ලබන්නේ නම් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 5.0 ට වැඩි දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් විය යුතුය.

ව්‍යාපෘතියට අවශ්‍ය කාර්යය මණ්ඩලය හඳුනා ගැනීම, ප්‍රමුඛ කාර්යය මණ්ඩලය බඳවා ගැනීම, රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ සංස්ථා සේවයේ නිලධාරීන් ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා බඳවා ගැනීම, වැටුප් සහ අනෙකුත් පහසුකම් තීරණය කිරීම, බාහිරින් බඳවා ගන්නා නිලධාරීන් සඳහා වැටුප් හා අනෙකුත් පහසුකම් තීරණය කිරීම, 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ XV පරිච්ඡේදයේ 32 ඡේදයට අනුව බදු ගෙවීම, ව්‍යාපෘති කාර්යය මණ්ඩලයේ අනෙකුත් පහසුකම්, නිවාඩු, විනය පාලනය, පාඩු පියවා ගැනීම, මෙහෙයවීම් කටයුතු කඩිනම් කිරීම සඳහා දිරි දීමනා ගෙවීම යන කරුණු මෙම චක්‍රලේඛයෙන් ආවරණය වෙයි.

මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන ව්‍යාපෘතීන් සහ සේවක මණ්ඩල කළමනාකරණය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධි විධාන බල පැවැත් වේ.

4. ව්‍යාපෘති අභ්‍යන්තර පාලන රාමුව තීරණය කෙරෙහි වැදගත් වන මුදල් රෙගුලාසි සහ ප්‍රමුඛ චක්‍රලේඛ

01. 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ 3 කොටසෙහි නව යෝජනා සම්බන්ධ 34, 35 හා 36 මුදල් රෙගුලාසි

අභ්‍යන්තර විගණනය සම්බන්ධ මුදල් රෙගුලාසි 133 හා 134

මුදල් පාලනය සම්බන්ධ කාර්යය පවරා දීම මු.රෙ. 135, 136, 137, 138

විදේශාධාර සම්බන්ධ පරිච්ඡේදය - මු.රෙ. 610 සිට 626 දක්වා

02. "විදේශාධාර ගිණුම් තැබීම" සම්බන්ධව 1994.04.20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ

03. "Withdrawals From Special Currency Accounts in the Central Bank of Sri Lanka " State Accounts Circular No -165/2003, Dated 17 th nov. 2003

04. "Guidelines & Procedures and Monitering Systems on the use of Asian Development Bank's Imprest Fund Procedure" State Accounts Circular No- 2002/ 149 – dated 27 th june 2002

05. "Recruitment Remuneration and management of project staff" Management Services Circular No – 33 dated 05 th April 2007 and 33 1 dated 20 th December 2007

06. "ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006" ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 , 2006 ජනවාරි 25 සහ ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය 2006 ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 09 බී 2006 මාර්තු 01

ඉහත මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධාන පදනම් කොට ගෙන ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රශ්නාවලිය සකස් කොට ඇත.

5 වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ද ඇතුළත් කර ගත යුතු අතර, හැකිතාක් දුරට මෙම මාර්ගෝපදේශ අදාළ කර ගනිමින් ව්‍යාපෘති අභ්‍යන්තර විගණන වැඩ සටහන් සකස් කරගෙන ඒ අනුව ව්‍යාපෘති කාලය තුළදීම කාර්යක්ෂම අභ්‍යන්තර විගණනයක යෙදෙමින් කාලීනව මෙන්ම වර්ධනාත්මකව වාර්තා කිර්ම තුළින් කළමනාකාර්ත්වයට සහාය වීමේ අවශ්‍යතාව අභ්‍යන්තර විගණනය අවධාරණය කළයුතු වේ. ඒ සඳහා අවශ්‍ය මිනිස් බල හා අනෙකුත් සම්පත් ප්‍රමාණවත් පරිදි ලබාදීමේ අවශ්‍යතාවය ද අවධාරණය කෙරේ.

වසන්ත ඒකනායක,
කළමනාකරණ විගණන අධ්‍යක්ෂ ජනරාල්,
මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

පිටපත : විගණකාධිපති

DMA/2010-5- g

ව්‍යාපෘති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශය

1. විදේශාධාර ගිණුම

අනු අංකය	විස්තරය	[illegible]	නිරීක්ෂණය	[illegible]	[illegible]
1.	*මූල්‍යකරණ මූලාශ්‍රය හඳුනා ගැනීම*				
i.	ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන පහත සඳහන් මූල්‍ය සංකේත යටතේ සපයා ඇත. එය පැහැදිලිව හඳුනාගත යුතුය. • විදේශාධාර ණය 12 • විදේශාධාර ප්‍රදාන 13 • ප්‍රතිපූර්ණය කළහැකි විදේශාධාර ණය 14 • ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර ප්‍රදාන 15 • ප්‍රතිපාර්ශවීය අරමුදල් 16 • විදේශාධාර ආශ්‍රිත දේශිය අරමුදල් 17	වාර්ෂික ඇස්තමේන්තුව			
ii.	විදේශාධාර වර්ගය පැහැදිලිව හඳුනාගත යුතුයි • ව්‍යාපෘති ආධාර (ණය,ණය මාලා,ප්‍රදාන) • ශිල්පීය සහය (ණය, ප්‍රදාන) • ද්‍රව්‍ය ආධාර (ණය, ප්‍රදාන) • වැඩසටහන් ආධාර (ණය, ප්‍රදාන) • ගෙවුම් ශේෂ පහසුකම් (ණය, ප්‍රදාන)	මු.රෙ. 611			
2.	*ව්‍යාපෘති පූර්වාරම්භක අවශ්‍යතා*				
i.	වාර්ෂික වියදම් ඇස්තමේන්තු කෙටුම්පතට ව්‍යාපෘති පිරිවැය ඇතුලත් කිරිමට පෙර පහත සඳහන් කොන්දේසි සපුරා තිබිය යුතුය. • සමස්ත පිරිවැය ඇස්තමේන්තු කිරිම. • ගිවිසුම් අත්සන් කිරිම • අරමුදල් ප්‍රවාහ කාල රාමුව සැකසිම • පසු විපරම් වැඩපිළිවෙල සහ • ව්‍යාපෘති නිමවුමේ අඛණ්ඩතාව සහතික කිරීමේ වැඩපිළිවෙල හා ක්‍රියාමාර්ග	මු.රෙ. 34			
ii.	ප්‍රථමික අනුමැතිය ලබා ගැනිමට පෙර ව්‍යාපෘතියක පහත සඳහන් වැඩ ඉටුකිරීමට ක්‍රියා නොකළ යුතුය. • ශක්‍යතා අධ්‍යනය හෝ ආශ්‍රිත කටයුතු • අයවැය අරමුදල් ලබාගැනිම සහ කුඩා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම • යම් ආංශික සැලැස්මක් හෝ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම	මු.රෙ.35			
iii.	පහත සඳහන් කටයුතු ඉටුකිරිමට පෙර ව්‍යාපාතිය සඳහා අවසන් අනුමැතිය ලබාගත යුතුය. • රාජ්‍ය ආයෝජන වැඩසටහන තුල ලැයිස්තුගත කිරීම • ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට අරමුදල් සැපයීම • මූල්‍යකරණ ආයතනය සමඟ අවසන් සාකච්ඡා	මු.රෙ.36			

iv	විදේශාධාර මුදල් තදෝචිත ආදායම් ශිර්ෂයට, විෂය අංකයට බැර කිරිම සඳහා අවශ්‍ය තොරතුරු රා.ගි. අධ්‍යක්ෂ ජනරාල්ට අප්‍රමාදව සපයන්නේද යන්න තහවුරු කරගන්න.	මු.රෙ. 620			
v	අත්තිකාරම් ගිණුමක් යටතේ උපයෝජිත මුදල් ප්‍රමාණය හා එහි මුල්‍යාකරණ විස්තර අත්තිකාරම් ගිණුමේ පාද සටහනක් මගින් පෙන්වා තිබේද යන්න තහවුරු කර ගන්න.	මු.රෙ. 621 (7)			
vi	රාජ්‍ය සංස්ථා / ව්‍යාපාරවලට දෙනු ලබන විදේශාධාර ණය සඳහා වාරික හා පොලිය නියමිත පරිදි ආපසු ගෙවන්නේද යන්න පරික්ෂා කරන්න.	මු.රෙ. 623			
vii	ව්‍යාපෘති ගිණුම් උපචිත පදනම පිළියල කිරිම හා ද්විත්ව සටහන් මුලධර්ම වලට අනුව පොත් හා වාර්තා පවත්වාගෙන යාම සිදුවන්නේදැයි පරික්ෂා කරන්න.	මු.රෙ. 626			
viii	ප්‍රතිපූර්ණයේදි විනිමය අනුපාත වෙනස්වීම්වල ගලපන ලද බලපෑම් ව්‍යපෘතියේ අවසන් ගිණුම්වල පෙන්වන්නේද යන්න පරික්ෂා කරන්න	රා.ගි.ච.2002/ 149			
ix	විගණකාධිපති විසින් සහතික කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රදානකරු වෙත ඉදිරිපත් කළ යුතුයැයි ගිවිසුමේ සඳහන්ව ඇතිවිට එසේ කරන්නේද යන්න පරික්ෂා කරන්න.	මු.රෙ. 626			
4.1	*ශිල්පීය සහය වැඩසටහන් යටතේ ලැබෙන විශේෂඥ සේවා ,ශිෂ්‍යත්ව හා පුහුණු*				
i	අදාල ආකෘති මගින් විශේෂඥ සේවා හා ශිෂ්‍යත්ව හා පුහුණු පහසුකම් පිළිබඳව කාර්තු වාර්තා විගණකාධිපතිට පිටපතක් සහිතව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරි පත් කරන්නේද යන්න පරික්ෂා කරන්න.	මු.රෙ.625(6)ආ			
4.2	*ව්‍යපෘතියක කොටසක් ලෙස ලැබෙන ශිල්පීය සහය*				
i	ව්‍යපෘති ආධාරයක පිරිවැයේ කොටසක් ලෙස ලැබෙන කාර්මික සහය එම ව්‍යපෘතියේ අනිකුත් සංරචකයන් සේ සලකා ගිණුම්ගතකර තිබේද යන්න පරික්ෂා කරන්න.	මු.රෙ.625 (6)අ, ඉ			
4.3	*ව්‍යපෘති ආධාර, ශිල්පීය සහයෝගිතා වැඩසටහන් හෝ අනපේක්ෂිත අවස්ථා යටතේ ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් ලැබෙන ප්‍රදාන*				
i	ඉහත සඳහන් ආකාරයේ විදේශාධාර ලැබීමක් පිළිබඳ විස්තර භාණ්ඩ ලේඛණයේ හෝ අදාල කාර්යය වෙනුවෙන් පවත්වා ගෙන යන අන්‍ය ලේඛණයක සටහන් කරන්නේද යන්න තහවුරු කර ගන්න.	මු.රෙ. 622			
ii	ඉහත සඳහන් ආකාරයේ විදේශාධාර ලැබීමක් ලද කල්හි එහි ගණනයකල වටිනාකම රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබාගත් ගිණුම සංකේතය යටතේ ගිණුම්ගතකර තිබේද යන්න පරික්ෂා කරන්න.	මු.රෙ. 625 (1) අ, ආ, ඇ. /රා.ගි.ච. 30/94 (5.2.1.) හා 3			
iii	රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ට යැවෙන පැවරුම් නියෝගයට වත්කම් සටහන් කළ ලේඛනයේ අදාළ පත්ඉරු අංකය දැක්වෙන සහතිකයක් අමුණා	රා.ගි. ච. 30/94 (5.2.5)			

	තිබේද යන්න පරීක්ෂා කරන්න.				
iv	විදේශාධාර ප්‍රතිපාදනයට කළ හර කිරීම් මු.රෙ. හි 14 වන පාරිශිෂ්ඨය අනුව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ට ත්‍රෛමාසිකව වාර්තා කරන්නේද යන්න පරීක්ෂා කරන්න.	මු.රෙ. 625(1)ඊ /රා.ගි. ච. 30/94 (5.5.6)			
v	උපකරණවල අයිතිය ව්‍යාපෘතිය අවසන් වන තෙක් ප්‍රදානකරු වෙත තබාගන්නා අවස්ථාවක වෙනම භාණ්ඩ ලේඛණයක් ඒ සඳහා පවත්වා ගන්නේද යන්න පරීක්ෂා කරන්න.	මු.රෙ. 625 (6) ඇ			
vi	ව්‍යාපෘතිය අවසානයේ එම උපකරණවල හිමිකම රජයට පවරන විට තක්සේරු මණ්ඩලයක් මගින් ඒවායේ වටිනාකම තීරණය කර තිබේද යන්න පරීක්ෂා කරන්න.	මු.රෙ. 625 (6) ඇ			
vii	ව්‍යාපෘතිය අවසානයේ හිමිකම ලද උපකරණ ප්‍රදානයක් සේ සලකා මු.රෙ. 625(1) අනුව ගිණුම්ගතකර තිබේද යන්න පරීක්ෂා කරන්න	මු.රෙ. 625 (6) ඇ			
4.4	*උපකරණ ද්‍රව්‍ය හා සේවාවන් වශයෙන් ලැබෙන ණය*				
i	ණය හා ණය මාලාවන්ට අදාලව කරන ලද ප්‍රතිලබ්ධයන් පිළිබඳ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් එවනු ලබන පැවරුම් පත්‍රය සමඟ සංසන්දනය කර විසර්ජන ලේජරයේ විදේශාධාර ප්‍රතිපාදන සඳහන්කර ඇති පත් ඉරුවේ සටහන්කර තිබේද යන්න තහවුරුකර ගන්න.	මු. රෙ.625 (2) ආ			
ii	උපකරණ හා ද්‍රව්‍යයන්ට අදාල විස්තර බඩු ලේඛණයේ / ඒ සඳහා පවත්වාගෙන යනු ලබන වෙනත් ලේඛණයක ඇතුලත් කර තිබේද යන්න පරීක්ෂා කරන්න.	මු. රෙ.625 (2) ඇ			
iii	හේතුව කුමක් වුවද, අදාල හර කිරීම් උචිත නොවන බව සලකන්නේ නම් ඒ බව විදේශ සම්පත් දෙපා: අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට දන්වා තිබේදැයි පරීක්ෂා කරන්න.	මු. රෙ.625 (2) ඇ			
iv	උපකරණ හා ද්‍රව්‍ය භාරගත් බව, ලේඛනගත කළ බව, හා හර කිරීම් නිවැරදි බව සහතික කරමින් මු.රෙ. සංග්‍රහයේ 15 වන පරිශිෂ්ඨය මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ට ත්‍රෛමාසිකව වාර්තා කරන්නේද යන්න පරීක්ෂා කරන්න.	මු. රෙ.625 (2) ඉ			
4.5	*ව්‍යාපෘතිමය මූල්‍ය ප්‍රදාන, ණය හෝ ශිල්පීය සහයෝගිතා මූල්‍ය ප්‍රදාන*				
i	අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව වෙත සෘජුවම මුදල් ප්‍රේෂණ ලැබුන විට ඒවා භාණ්ඩාගාරයේ තැන්පත් කිරීමට පියවරගෙන තිබේද යන්න පරීක්ෂා කරන්න.	මු. රෙ.625(3)			
ii	යම් බැඳීමක් ඇතිකර ගැනීමට හෝ වියදමක් දැරීමට පෙර ප්‍රදාන තැන්පත් ගිණුමෙන් මුදල් වෙන්කර ගෙන තිබේද යන්න පරීක්ෂා කරන්න.	මු. රෙ.625(3)			
iii	වියදම් මුදල් පොතට බැර කරමින් හා විදේශාධාර ප්‍රතිපාදන හර කරමින් නිවැරදිව ගිණුම් තබන්නේද යන්න පරීක්ෂා කරන්න.	මු. රෙ.625 (3) අ			

iv	මු.රෙ. සංග්‍රහයේ 16 වන පරිශිෂ්ඨය මගින් ත්‍රෛයිමාසිකව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ට හා විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ට විදේශාධාර වියදම් පිළිබඳ වාර්තා කරන්නේද යන්න පරීක්ෂා කරන්න.	මු. රෙ. 625 (6) ඇ			
v	විදේශ රාජ්‍ය හෝ නියෝජිතායතන වෙතින් මුදල් ප්‍රේෂණ ස්වරූපයෙන් ණයක් ලැබෙන විට ඒ සම්බන්ධව මු.රෙ. 625(3) හි පෙන්වා ඇති පරිදි කටයුතු කර තිබේද යන්න පරීක්ෂා කරන්න.	මු. රෙ.625(4)			
5.	*විදේශාධාර උපයෝජනය*				
5.1	*ප්‍රතිපූර්ණ පටිපාටිය*				
i	ප්‍රතිපූර්ණය කළහැකි විදේශාධාර සඳහා වෙනමම බැංකු ගිණුමක්, මුදල් පොතක් හා අග්‍රිම ගිණුමක් අදාල අමාත්‍යාංශය / දෙපාර්තමේනතුව විසින් පවත්වා ගෙන යන්නෙදැයි තහවුරු කර ගන්න.	රා.ගි.ච. 30/94 (5.6.2)			
ii	රා.ගි.ච. 30/94 හි ඇමුණුම් අංක VI පරිදි අනුක්‍රමිකව අංක කළ අග්‍රිම ඉල්ලුම් පත් එක් එක් මාසයේ 7 වන දිනට හෝ ඊට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ට යවන්නේද යන්න සහතික කර ගන්න	රා.ගි.ච. 30/94 (5.6.4)			
iii	සෑම මාසකම 7 වන දින හෝ ඊට පෙර ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර ගිණුමේ සහතික කළ බැංකු සැසඳුම් ප්‍රකාශය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ට යවන්නේද යන්න තහවුරු කරගන්න.	රා.ගි.ච. 30/94 (5.6.4)			
iv	රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර ඉල්ලුම් කිරිමේදි අවශ්‍ය සංශෝධන සහිතව 30/94 චක්‍රලේඛණයේ VI ඇමුණුම භාවිතා කරමින් එය ප්‍රධාන ගනන්දීමේ නිලධාරි මගින් රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ට ඉදිරිපත් කරන්නේද යන්න පරීක්ෂා කරන්න.	රා.ගි.ච. 30/94 (5.6.17)			
v	ප්‍රතිපූර්ණය කිරිමේ සියළු ගෙවීම්, මහ බැංකුවේ ඇති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට බැරකළ යුතු බවට ඉල්ලුම්පත්වල සඳහන් කර තිබේද යන්න තහවුරු කරගන්න.	මු. රෙ.625 (5)ඇ			
vi	සැලකිය යුතු තරම් විශාල වටිනාකමක් සහිත ප්‍රතිපූර්ණ ඉල්ලීම් පැනනගින අවස්ථාවක මාසිකව ඉදිරිපත් කරන ඉල්ලීම් වලට අමතරව එම ඉල්ලීම් අප්‍රමාදව ඉදිරිපත් කරන්නේදැයි තහවුරු කරගන්න.	ADB-LHD 2007 chapter 9			
vii	ණය ගිවිසුම මගින් SOE පරිටිපාටිය යොදා ගැනිමට ප්‍රතිපාදන සලසා නොමැති අවස්ථාවක එය භාවිතා කිරීමට තරම් මූල්‍ය හා පරිපාලන හැකියාවක් පවතීද යන්න තහවුරු කරගන්න.	ADB-LHD 2007 chapter 9			
viii	ගිවිසුම්ගත කොන්දෙසිවලට අනුකූලව SOE හි දැක්වෙන සියළු වියදම් දරා තිබේද යන්න හා බලයලත් නිලධාරියෙකු විසින් වියදම් ප්‍රකාශයට ලබාදෙන සහතිකය පිළිබද සෑහීමට පත්විය හැකිද යන්න පිළිබද තහවුරු කර ගන්න.	ADB-LHD 2007 chapter 9			

IX	ADB විමර්ශන කාණ්ඩායම් හෝ ස්වාධීන විගණකයින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ හැකි පරිදි වාර්තා හා ලේඛන මාර්ගෝපදේශයන්ට අනුව නඩත්තු කරන්නේද යන්න පරික්ෂා කරන්න	ADB-LHD 2007 chapter 9			
X	වියදම් ප්‍රකාශනයේ දැක්වෙන වියදම් සීමාවන්ට අනුකූලවීම සඳහාම ගෙවීම් කොටස් වශයෙන් නොදක්වන බව තහවුරු කරගන්න.	ADB-LHD 2007 chapter 9			
XI	ව්‍යාපෘති කළමණාකරණය විසින් හඳුන්වාදී ඇති අභ්‍යන්තර පාලන උපක්‍රමවල යෝග්‍යතාවය ඇගයීමට ලක්කරන්න. එමෙන්ම වියදම් ප්‍රකාශ පාරිපාටියට යටත් ගණුදෙනු පිළිබඳ විගණන මතය පරික්ෂා කරන්න.	ADB-LHD 2007 chapter 9			
XII	සමුහ ගිණුම් වලට අදාල ලේඛන (Force Account Documents) මත පදනම්ව ප්‍රතිපූර්ණ අයදුම් පත්‍ර ඉදිරිපත් කිරිමේදි අනනුකූල වියදම් වැලැක්විම සඳහා බලයලත් නිලධාරින් විසින් පළමු හා දෙවන සහතික කිරිම සිදුකිරිම වැනි හඳුන්වා දි ඇති අභ්‍යන්තර පාලන ක්‍රම පරික්ෂා කරන්න.	ADB-LHD 2007 chapter 9			
XIII	සුදුසුකම් සහිත සංවර්ධන මුල්‍ය ආයතන හරහා කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයන්ට ලබාදෙන උපණය අනුමත කිරිමේ හා අරමුදල් නිදහස්කර ගැනීමේ තනි අයදුම් පත්‍ර ක්‍රියාමාර්ගය (SAW) යොදාගන්නා විට සහය ලේඛන සහිතව තෝරාගත් නියදියක් පරික්ෂාකර නිසි ක්‍රියාපිළිවත අනුගමනය කර තිබේද යන්න තහවුරු කර ගන්න.	ADB-LHD 2007 chapter 9			
XIV	ප්‍රතිපූර්ණ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට හෝ ප්‍රමාද කිරිමට හේතු හඳුනාගනිමින් එකාබද්ධ අරමුදල මත අනවශ්‍ය පීඩාවක් අතිවීම වැලැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පරික්ෂා කරන්න.	මු.රෙ. 625 (5) අ			
XV	මුදල් රෙගුලාසි, අදාල චක්‍රලේඛ හා මූල්‍ය ආයතන මාර්ගෝපදේශ පරිදි ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් සකසා ඉදිරිපත් කරන්නේදැයි තහවුරු කර ගන්න.	මු.රෙ. 625 (5) ආ.			
XVI	ප්‍රතිපූර්ණය කළහැකි විදේශාධාර වලින් අනුචිත වියදම් ප්‍රතිපූර්ණය කිරිමට ඉල්ලුම්කර තිබේද යන්න පරික්ෂාකර ආයතන ප්‍රධානීන් එවැනි තත්ත්වයන් වැලැක්වීමට පියවර ගෙන තිබේද යන්න තහවුරු කර ගන්න.	රා.ගි.ච. 30/94 (5.6.18)			
XVII	ඉල්ලුම්කළ හා ලැබුණු ප්‍රතිපූර්ණ සැසඳිම හා යම් වෙනසක් තිබේ නම් ඒ බව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරීට මෙන්ම රාජ්‍ය මුදල්, භාණ්ඩාගාර මෙහෙයුම් හා විදේශ සම්පත් යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට දැන්වීමටත් ඒ පිළිබඳව මූල්‍ය ආයතනය සමඟ කටයුතු කිරීමටත් පියවර ගෙන තිබේද යන්න පරික්ෂා කරන්න.	රා.ගි.ච. 30/94 (5.6.11)			
XVIII	ප්‍රතිපූර්ණ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරිමකදී භාණ්ඩාගාර අනුමැතිය සහිතව එකී වියදම් එකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදනවලට මාරුකර තිබේදැයි පරික්සන්න	රා.ගි.ච. 30/94 (5.6.12)			

xix	ප්‍රතිපූර්ණයයන් සඳහා ඉල්ලීම් හා ලැබීම් පිළිබඳ වාර්තාවක් 30/94 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ vii ඇමුණුම පරිදි පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කරන්න.	රා.ගි. ච. 30/94 (5.6.14)			
xx	ප්‍රධාන ගණන්දීමේ හා ගණන්දීමේ නිළධාරීන් විසින් ප්‍රතිපූර්ණ ලැබිය යුතු සියළු ව්‍යාපෘති වෙනුවෙන් සමුච්ත වියදම්, ප්‍රතිපූර්ණ ඉල්ලීම් හා ලැබීම් පෙන්නුම් කරන වාර්තාවක් 30/94 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ viii ඇමුණුම පරිදි රාජ්‍ය ගිණුම් හා විදේශ සම්පත් යන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඉදිරිපත් කරන්නේද යන්න පරීක්ෂා කරන්න.	රා.ගි. ච. 30/94 (5.6.15) මු.රෙ.625 (5) එ.			
5.3	*විශේෂ විදේශාධාර මුදල් ගිණුම*				
i	විශේෂ විදේශාධාර මුදල් ගිණුම චක්‍රිය පදනමක් මත පවතින විට ප්‍රතිසම්පාදන ඉල්ලුම් පත් නියමිත අවමයට යටත්ව මාසිකව ඉදිරිපත් කරන්නේද යන්න හා එසේ නොවන විට ලබාගත් අත්තිකාරම් වියදම් කිරීමට පියවර ගෙන තිබේද යන්න පරීක්ෂා කරන්න.	මු.රෙ.625 (8) ආ.			
ii	විශේෂ ගිණුම හරහා නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ ගිණුමට ප්‍රතිපූර්ණය කළහැකි විදේශාධාර ප්‍රත්පූර්ණය කිරීමට පියවර ගෙන තිබේද යන්න පරීක්ෂා කරන්න.	මු.රෙ. 625(8)ඇ. රා.ගි.ච. 30/94 (5.9.3)			
iii	අරමුදල් නිදහස් කර ගැනීමේදී රා.ගි.ච 165/2003 හි දැක්වෙන ක්‍රියාමාර්ගවලට දක්වන අනුකූලතාව ඇගයීමට ලක්කරන්න.	රා.ගි.ච. 165/2003			
iv	මහ බැංකු විශේෂ (විදේශ මුදල්) ගිණුම් ප්‍රකාශය ලද පසු එය පෞද්ගලිකවම ව්‍යාපෘති අධ්‍යක්ෂක / ගණකාධිකාරි විසින් සංසන්දනය කර විෂමතාවක් ඇතොත් ඒබව මහ බැංකුවට හා භාණ්ඩාගාරයට දැන්වීමට ක්‍රියා කරන්නේදැයි තහවුරු කරගන්න.	ර.ගි.ච.30/94 (5.9.4) රා.ගි.ච. 165/2003 (7)			
v	මහ බැංකු ගිණුම් ප්‍රකාශය ලැබීමේ ප්‍රමාදයක් වේනොත් එය ගෙන්වා ගැනීමට නිසි පියවර ගෙන තිබේද යන්න පරීක්ෂා කරන්න.	රා.ගි. ච. 165/2003 (7)			
vi	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියට යවන හර නිවේදන අදාල වැය ශීර්ෂයට හර කළ වහාම නැවත එම දෙපාර්තමේන්තුවට යවා තිබේද යන්න පරීක්ෂා කරන්න.	රා.ගි.ච. 165/2003 (8)			
vii	විශේෂ ගිණුම් චක්‍රිය පදනමක් මත නොවන කල්හි ලබාගත් අත්තිකාරම් පියවූ මුදල හා ශේෂය දැක්වෙන මාසික ප්‍රකාශනයක් විදේශ සම්පත්, භාණ්ඩාගර මෙහෙයුම් හා කළමණාකරණ විගණන යන දෙපාර්තමේන්තුවලට ඉදිරිපත් කරන්නේද යන්න පරීක්ෂා කරන්න.	රා.ගි.ච.30/94 (5.9.5)			
viii	ව්‍යාපෘතියේ අවශ්‍යතාවන්ට අනුව අදාල ආයතන වල අනුමැතිය සහිතව ප්‍රථම ,දෙවන හා තෙවන අදියරයන්ට අයත් අග්‍රිම ගිණුම් ක්‍රියාත්මක කළ හැක. එවැනි ඕනෑම අධියරකට අදාලව නොපියවූ ශේෂ හදුනා ගැනීම සඳහා අග්‍රිම ලේඛණ නිසිලෙස නඩත්තු කරන්නේද යන්න පරීක්ෂා කරන්න.	රා.ගි.ච. 2002/149 (3.10)			

ix	පහත සඳහන් ලේඛන නිසි ලෙස නඩත්තු කරන්නේද යන්න පරික්ෂා කරන්න. - මුදල් පොත - වැය ලෙජරය - ජ'නල් - මුදල් නිදහස් කර ගැනීමේ අයදුම්පත් ලේඛණය - එක් එක් අධියරට අදාල අග්‍රිම අරමුදල් ලේඛණ - අග්‍රිම අරමුදල් තුලන ලේඛණය - පළමු සහ දෙවන අග්‍රිම නිදහස් කිරීමේ සාමාන්‍ය ලෙජර ගිණුම - තෙවන අදියර අග්‍රිම අරමුදල් නිදහස් කිරීමේ ලේඛනය - තෙවන අදියර අග්‍රිම අරමුදල් ලේඛණය	රා.ගි.ව. 2002/149 (4.1)			
x	විදේශාධාර ආයතනයේ අනුමැතිය නොලබන වියදමක් දරා ඇති විට පවතින හැකියාව තුල නැවත ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම්කර තිබේද යන්න පරික්ෂා කරන්න.	රා.ගි.ව. 2002/149 (4.4)			
xi	දරණ ලද යම් වියදමක් සඳහා ණය දෙන ආයතනයේ අනුමැතිය නොලැබෙන විට විනිමය අනුපාත විචලන අවාසි අවම වන පරිදි අප්‍රමාදව එම මුදල අග්‍රිම ගිණුමට පියවීම සඳහා හෝ අත්‍යාසන්න අරමුදල් ඉල්ලුම් පත්‍රයෙන් අඩුකර ගැනීමට පියවර ගෙන තිබේද යන්න පරික්ෂාකරන්න.	රා.ගි.ව. 2002/149 (4.4)			
xii	ප්‍රථම, දෙවන හා තෙවන අදියරයන්ට අයත් අග්‍රිම ගිණුම් අන්‍යෝන්‍ය වශයෙන් මාසිකව සසඳන්නේද යන් පරික්ෂා කරන්න.	රා.ගි.ව. 2002/149 (4.5)			
xiii	ව්‍යාපෘති කාර්යාලය විසින් නඩත්තු කෙරෙන අග්‍රිම පාලන ගිණුම මහබැංකු ප්‍රකාශනය සමඟ තුලනය කරන්නේද යන්න පරික්ෂාකරන්න.	රා.ගි.ව. 2002/149 (4.5.1)			
xiv	මහ බැංකුවේ බැංකු ප්‍රකාශනයෙහි පෙන්වන විනිමය අනුපාත විචලනය මත පදනම් වූ ප්‍රති අගය කිරීම්වල සම්පූර්ණ වාසිය හෝ අවාසිය ව්‍යාපෘතියේ අවසන් ගිණුම්වල වෙනම අයිතමයක් ලෙස පෙන්වන්නේද යන්න පරික්ෂා කරන්න.	රා.ගි.ව. 2002/149 (4.6)			
xv	සමස්ථ වර්ෂය සඳහාම අග්‍රිම ගිණුම් තුලන ප්‍රකාශනයක් සකස්කර අවසන් ගිණුම්වල අමුණා තිබේද යන්න පරික්ෂා කරන්න	රා.ගි.ව. 2002/149 (4.7)			
[illegible]	*භාණ්ඩ හෝ වැඩසටහන් අධාර සම්බන්ධ අරමුදල් උපයෝජනය*				
i	වෙළඳ ද්‍රව්‍ය හෝ වැඩසටහන් ආධාර යටතේ ලැබෙන සියළු ආනයනයන් රාජ්‍ය බැංකු හරහා සිදුවිය යුතුය. නැව්ගත කිරීමේ ලියවිලි කිසිවක් ආනයනකරුට සෘජුවම ලබාදීමෙන් වලකින ලෙස සැපයුම්කරුවන්ට උපදෙස් දී තිබිය යුතුය. එම ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේද යන්න පරික්ෂා කරන්න.	මු.රෙ.625(7)ආ			
ii	රාජ්‍ය සංස්ථා/ව්‍යාපාර භාණ්ඩ ආනයනය කිරීමේදී එය එකී ආයතනික මුදල් වලින්ම ගෙවිය යුතුය. එවැනි ගෙවීම් ලබන බැංකුව, මහ බැංකුවේ ඇති ප්‍රතිපාර්ශවිය අරමුදල් ගිණුමට බැරට ප්‍රේෂණය කළ	මු.රෙ.625(7)ඇ			

	යුතුය. එම ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේද යන්න පරීක්ෂා කරන්න.				
6.	*ව්‍යාපෘතිය අවසන් කිරීම*				
i	ආයතනය විසින් ව්‍යාපෘතිය අවසන් කිරීමේද පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළයුතුය • බැංකු ගිණුම් තුලනයකර වසා දැමීම. • ආදල මූල්‍ය ආයතනය විසින් නිකුත්කර ඇති මාර්ගෝපදේශ හා ගිවිසුම් කොන්දේසිවලට අනුව අවසන් ගිණුම් සකස් කර තිබිය යුතුය. • එම ගිනුම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතුය. • මු.රෙ.401 අනුව ව්‍යාපෘති වත්කම් පවරාගැනීම් අවසන් කිරීම. • ප්‍රධාන ගණනන් දිමේ නිලධාරියා සහ ගනන් දිමේ නිලධාරියා විදෙස් අරමුදල් ආයතනය හා එකඟ වූ ආකාරයට ව්‍යාපෘතිය අවසන් කිරීමේ කටයුතු ඉටුකළ යුකතු අතර නියමිත කාලසීමාව තුල ව්‍යාපෘති ගිණුම් පිළියෙලකර අදල මූල්‍ය ආයතනයට භාරදිය යුතුය. ඒ අනුව කටයුතුකර තිබේද යන්න පරීක්ෂා කරන්න.	පොදු			
ii	විශේෂ (විදේශ මුදල්) ගිණුමෙ එක් එක් අදියරයෙහි අග්‍රිම ගිණුම් ආශ්‍රිත ගෙවීම් වලට අදාළ සියළුම උපකාරක ලේඛණ විගණනයෙන් පසු වසර 5ක් සන්තකයේ තබා ගැනිමට හා ව්‍යාපෘතිය අවසන් වූ පසු අදාල අමාත්‍යාංශයට /දෙපාර්තමේනතුවට එය පැවරිමට කටයුතු කර තිබේදැයි පරීක්ෂා කරන්න.	රා.ගි.ව. 2002/149 (3.11)			

2. ව්‍යපෘති පිරිස් කළමණාකරණය

අනු අංකය	විස්තරය	[illegible]	[illegible]	[illegible]	[illegible]
7.	*ව්‍යපෘති කාර්යය මණ්ඩල බඳවා ගැනීමේ පූර්ව අවශ්‍යතා*				
i.	කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 33 යටතේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා පහත සඳහන් කොන්දේසි සපුරා තිබේද යන්න පරික්ෂා කරන්න. • ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූලික තක්සෙරුව ලබාගැනීම • විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූලික අනුමැතිය ලබාගැනීම • අමාත්‍යය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම • සේවකයින් බඳවා ගැනීම සම්බන්ධ කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය ලබා ගැනීම.	ක.සේ.ච.33 (1.1.1)			
ii.	ව්‍යාපෘතිය පහත සඳහන් සීමාවන්ට අනුකූල වේද යන්න පරික්ෂා කරන්න. • ව්‍යපෘති කාලය වසර 2 කට වැඩිවීම • අවම වශයෙන් පිරිවැයෙන් 50%ක් විදේශ මූලාශ්‍රවලින් මූල්‍යනය වීම • උපදේශන ගාස්තු විදේශ අරමුදල් වලින් 20% ක් නොයික්ම වීම • මුළු ව්‍යපෘති පිරිවැය ඇ.ඩො. මිලියන 5කට අඩු නොවීම • ව්‍යපෘතිය දේශීය මූල්‍යනය මත පදනම් වුවද ව්‍යපෘති පිරිවැය ඇ.ඩො. මිලියන 5 කට අඩු නොවීම.	ක.සේ.ච.33 (1.1.2; 1.1.3; 1.1.4)			
8.	*කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම*				
i.	ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමට භාර අමාත්‍යයාංශය /දෙපාර්තමේනතුවේ පවතින කාර්ය මණ්ඩල සීමාව තුල ව්‍යපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බලා තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.1.1)			
ii.	ව්‍යපෘති කාර්යයන් කරගෙන යාම සඳහා වෙනම කාර්ය මණ්ඩල බඳවා ගැනීම අවශය වන අවස්ථාවලදී ව්‍යපෘතියේ මූලික අනුමැතිය ලබාගෙන තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.1.2)			
iii.	එම කාර්ය මණ්ඩලය විදේශ සම්පත්, අයවැය කළමනාකරණ සේවා, ක්‍රමසම්පාදන හා රාජ්‍ය ව්‍යාපාර යන දෙපාර්තමේන්තුවල ප්‍රධානින්ගෙන් සමන්විත කමිටුවක අනුමැතිය ලබාගෙන තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.1.2)			
iv.	අනුමත කාර්ය මණ්ඩලය හා වැටුප් ව්‍යුහය ව්‍යපෘති ගිවිසුමට ඇතුලත්කර තිබේද යන්න තහවුරු කර ගන්න	ක.සේ.ච.33 (2.1.2)			

9.	*ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම*				
i	මූලික ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වැඩ ඇරඹිය යුතු කාල සීමාව ව්‍යාපෘතියේ තක්සේරු අදියරෙදි තිරණය කර තිබිය යුතුය. එම කාර්ය මණ්ඩලය හඳුනාගෙන බඳවා ගැනීම් පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.2.2)			
ii	ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන සලසා ගැනිමට ක්‍රියාකර තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.2.3)			
iii	විවෘත ප්‍රචාරණයක් හා අයදුම් පත්‍ර කැඳවීමෙන් අනතුරුව පැවැත්වෙන සම්මුඛ පරික්ෂණයකින් සියළු තනතුරු සඳහා බඳවා ගැනීම් කර තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.2.4)			
iv	USD මිලියන 30 සමාන /වැඩි ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂක පත්කිරිම මුදල් අමාත්‍යාංශයේ ලේකම්/භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් මූලිකත්වය දරන අදාල අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් සභා ප්‍රධාන ලේකම් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනයේ ප්‍රධානින්ගේන් සමන්විත සම්මුඛ පරික්ෂණ මණ්ඩලයක් හරහා සිදුකර තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.2.5)a			
v	USD මිලියන 30 හෝ ඊට අඩු ව්‍යාපෘති සඳහා අධ්‍යක්ෂකවරු බඳවා ගැනිමේදි අමාත්‍යාංශ ලේකම්ගේ /පළාත් ප්‍රධාන ලේකම්ගේ මූලිකත්වයෙන් හා මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ අයාතනයේ ප්‍රධානියාගෙන් සමන්විත සම්මුඛ පරික්ෂණ මණ්ඩලයක් හරහා සිදුකර තිබේද යන්න තහවුරුකර ගන්න.	ක.සේ.ච.33 (2.2.5)b			
	ව්‍යාපෘතියේ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරින් බඳවා ගැනිමේ සම්මුඛ පරික්ෂණ මණ්ඩලය අමාත්‍යාංශ ලේකම්/පළාත්සභා ප්‍රධාන ලේකම් සහ ව්‍යාපෘති අධ්‍යක්ෂක හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ ආයතනයේ ප්‍රධානියාගෙන් සමන්විත විද යන්න තහවුරු කර ගන්න.	ක.සේ.ච.33 (2.2.5)c			
	අනෙකුත් සහය කාර්ය මණ්ඩල බඳවා ගැනිම ව්‍යාපෘති අධ්‍යක්ෂක මූලිකත්වය දරණ, අදාළ අමාත්‍යාංශයේ /පළාත් සභාවේ හා ක්‍රියාත්මක කරන ආයතනයේ නියෝජිතයන්ගෙන් සැකසී තිබුනිද යන්න තහවුරුකර ගන්න.	ක.සේ.ච.33 (2.2.5)d			
	ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ එක් එක් සමාජිකයා රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛන 33(1) හි දැක්වෙන සුදුසුකම් සපුරා තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.2.9; 3.1) ක.සේ.ච.33(1)			
	ව්‍යාපෘති අධ්‍යක්ෂක සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය පත්කිරිම බලධාරියා ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ ආයතනයේ ප්‍රධානියාද සෙසු කාර්ය මණ්ඩලය පත්කිරිමේ බලධාරියා ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂකද කටයුතු කර තිබේද යන්න තහවුරු කර ගන්න.	ක.සේ.ච.33 (2.2.6)			

x	සියළු පත්වීම් වාර්ෂික කාර්ය සාධන මත වසර 3ක් දක්වා උපරිම වශයෙන් දීර්ඝ කළහැකි පරිදි කොන්ත්‍රාත් පදනම මත ලබාදිය යුතුය. ඒ අනුව කටයුතු කර තිබේද යන්න තහවුරු කර ගන්න.	ක.සේ.ච.33 (2.2.7; 9.1)			
xi	වාර්ෂික කාර්යක්ෂමතා ඇගයීම් නිර්නායක පිළියෙල කිරිමේදි අරමුදල් සම්පාදකගේ උපදෙස් ලබාගෙන තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (9.1)			
xii	වයස අවු 57 ඉක්මවූවන් සඳහා ව්‍යපෘතිය තුළ පත්වීම් ලබාදි තිමේදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (2.2.8)			
10.	*රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් කරන පත්වීම*				
i	ඉහත සේවාවන්ගෙන් පහත සඳහන් කාණ්ඩ යටතේ ව්‍යපෘතිය සඳහා සේවකයින් බඳවා ගැනිමේදි පහත සඳහන් කරුණු සම්බන්ධව ඇති අනුකුලතාව පරික්ෂා කරන්න. • රාජ්‍ය සේවයේ සේවා කාලය තුල වසර 5කට නොවැඩි වන සේ පූර්ණ කාලීන පදනම මත නිදහස් කෙරෙන අයකු දැනට දරණ තනතුරේ වැටුපට අමතරව ව්‍යාපෘති තනතුරට හිමි වැටුපපෙන් 50%ක් සමග මෙම චක්‍රලේඛයේ 4.2.1වැටුප් සීමාව නොයික්මවන වැටුපකට හිමිකම ඇත. • රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/99 අනුව වසර 5ක් නොයික්මවන සේ වැටුප් රහිත නිවාඩු මත ව්‍යාපෘති තනතුරක් සඳහා නිදහස්කළ හැක. ඊට හිමි වැටුප මෙම චක්‍රලේඛයේ 4.2.1 අනුව තීරණය වේ. • රාජ්‍ය සේවකයෙක් වැඩ බැලිමේ පදනම මත / වැඩ ආවරණ පදනම මත නිදහස්කළ හැක. එහිදී වැඩ ආවරණය කෙරෙන තනතුරට හිමි වැටුපෙන් 1/3ක අමතර දීමනාවක් ලැබීමට හිමිකම් ඇත.	ක.සේ. ච. 33 (3.1)a; 4.1.1 ක.සේ. ච. 33 (3.1)b; 4.1.2 ක.සේ. ච. 33 (3.1)c; 4.1.3			
ii	ව්‍යාපෘතියේ සියළු කාර්ය මණ්ඩල දීඇති වැටුප් පරාසය තුල පළමු පියවරේ ස්ථාපිත කළ යුතුය. මේ සම්බන්ධව අනුගමනය කර ඇති ඇති ක්‍රියාමාර්ගයේ නිරවද්‍යතාව පරික්ෂා කරන්න.	ක.සේ. ච. 33 (4.2.2)			
iii	ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වාර්ෂික වැටුප් වර්ධක තනතුරට හිමි වැටුප් පරාසය තුල කාර්යසාදනය මත පදනම්ව ලබාදිය යුතුය. කාර්ය සාදනය තක්සේරු කිරීම සඳහා හඳුන්වාදී ඇති නිර්නායක් හඳුනාගෙන අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (4.2.2)			
iv	රාජ්‍ය සේවයෙන් බැහැරව බඳවාගත් සහය කාර්ය මණ්ඩලවල වැටුප් රාජ්‍ය සේවයේ සමාන්තර තනතුරුවලට අයක් මූලික වැටුප් පියවරෙන් ආරම්භකළ යුතුය. එවැනි කාර්ය මණ්ඩලවල වැටුප්වල නිවැරදිතාව පරික්ෂා කරන්න.	M.S. Cir. 33 (4.2.3)			
11	*අදායම් බදු ගෙවීම*				
i	ව්‍යපෘති කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 2006 අංක	ක.සේ.ච.33			

	10 දරණ දේශීය ආදායම් පනතේ 15 වන පරිච්ඡේදයේ 132 වගන්තිය අනුව ආදායම් බදු ගෙවීම් සඳහා ඉල්ලුම් කර තිබේද යන්න පරික්ෂා කරන්න.	(4.2.5)			
12	*වැන්දඹු හා අනත්දරු අරමුදල / සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා දායකවීම*				
i	රජයේ සේවයෙන් බැහැරව බඳවාගත් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හා වැටුප් රහිත නිවාඩු මත රජයේ සේවයෙන් බඳවාගත් නිලධාරීන් සේවක අර්ථ සාධක / සේවක භාරකාර අරමුදල් සඳහා දායකවී ඇද්ද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (4.3.1)			
ii	පූර්ණකාලින පදනම / වැඩ බැලීමේ හෝ ආවරණය කිරීමේ පදනම මත බඳවාගත් රජයේ නිලධාරීන් අඛණ්ඩව වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක ගෙවීම් කරන්නේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (4.3.2)			
iii	පූර්ණකාලින පදනම මත රජයේ සෙවයෙන් බඳවාගත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් දායකත්වය ලෙස සේවා යෝජක වර්තමාන තනතුරට හිමි වැටුපෙන් 25%ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවන්නේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (4.3.3)			
13.	*වෙනත් බැඳීම් හා වගකීම*				
i	ණය හා අත්තිකාරම් වැනි අයවිය යුතු වෙනත් ලැබීම් යථා පරිදි අයකර ගන්නේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (4.3.4)			
ii	ආධාර සපයන විදේශීය ආයතනයක නිලධාරියෙකු කැටුවජොය්ෂ්ඨ ව්‍යාපෘති නිලධාරියකු ක්ෂේත්‍ර චාරිකාවක නිරතවීමේදී දැරීමට සිදුවන නේවාසික වියදම් ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා පත්කිරීමේ බලධාරියාගේ පූර්ව අනුමැතිය ලබා තිබේද යන්න හා සෙසු කාර්ය මණ්ඩලයට ගෙවන සංයුක්ත දීමනා රාජ්‍ය සේවයට සමානුපාතිකවේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (5.1)a හා b			
iii	ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ඉන්ධන දීමනාව දෙපාර්තමේන්තු ප්‍රධානියකුගේ ඉන්ධන දීමනාවට සමාන වන අතර අතිරේක ඉන්ධන අවශ්‍යතා සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට භාර ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබාගත යුතුය. ඒ අනුව ක්‍රියාකරන්නේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (5.2 හා 5.3)			
iv	ව්‍යාපෘති කාර්ය මණ්ඩලය තම පූර්ව රැකියා ස්ථානවලදී බුක්තිවිදි නිවාඩු ප්‍රතිලාභ/වෛද්‍ය ප්‍රතිලාභ/ පාරිතෝෂික හෝ වෙනත් එවන් දිරිගැන්වීම් ලැබීමට හිමිකම් නොමැති අතර ඒ අනුව ක්‍රියා කරන්නේද යන්න තහවුරුකර ගන්න.	ක.සේ.ච.33 (5.4)			
v	අර්ධකාලින හෝ වැඩබැලීමේ පදනම මත බඳවා ගත් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයෙ නිවාඩු ලබා ගැනීම සාප්පු හා කාර්යාල පනතට අනුකූලද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (6.1)			
vi	ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ නිර්දේශයට යටත්ව විදේශ අරමුදල් පාදක ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩල සඳහා එක් කෙටිකාලින පුහුණු පාඨමාලාවකට	ක.සේ.ච.33 (8.1)			

	සහභාගිවීමට අවසර ඇති අතර ඒ සඳහා ප්‍රතිපාදන තිබිය යුතුය. ඒ අනුව ක්‍රියාකර තිබේද යන්න පරික්ෂා කරන්න.					
vii	ව්‍යපෘති මෙහෙයුම් කමිටු සමාජිකයින්ට රැස්වීම් සඳහා දීමනා ගෙවීම කළමණාකරණ චක්‍රලේඛ 33ට අනුකූලව සිදුවේද යන්න පරික්ෂා කරන්න.	ක.සේ.ච.33 (11.1හා11.2)				
viii	කිසියම් හේතුවක් මත ව්‍යපෘතිය ප්‍රමාද වන්නේ නම් හෝ පිරිවැය ඉහළ යයි නම් එය අදාල අමාත්‍යාංශයේ ලේකම් මගින් ලිඛිතව මුදල් අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර තිබේද යන්නත් එය ව්‍යපෘති අධ්‍යක්ෂකගේ පාලනයෙන් බැහැර හේතුවක් නිසා මිස වෙනත් ඕනෑම හේතුවක් නිසා සිදුව තිබේ නම් මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව ක්‍රියාකර තිබේද යන්නත් තහවුරු කරගන්න.	ක.සේ.ච.33 (12.3)				

3. ව්‍යාපෘති කාර්යසාධනය

අනු අංකය	විස්තරය	නිර්ණායක	නිරීක්ෂණය	[illegible]	ඇගයුම
14.	*ව්‍යාපෘති අධීක්ෂණය හා ප්‍රගතිය*				
i	ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීමේ හා ප්‍රගතිය විමසීමේ ක්‍රමවේදය ව්‍යාපෘති කළමණාකරණය විසින් ස්ථාපිත කළ යුතුය. ඒ අනුව හඳුන්වාදී ඇති ක්‍රමවේදයන් හඳුනාගන්න.				
ii	ප්‍රගතිය ඇගයීමේ ආසන්නතම වගකීම ව්‍යාපෘති කළමනාකරණ /මෙහෙයුම් ඒකක/ය වෙත පැවරේ. පවතින ඇගයුම් ක්‍රමයේ ප්‍රමාණවත්භාවය හා කාර්යක්ෂමතාව පරීක්ෂාකර දුර්වලතා ඇතොත් වාර්තා කරන්න. එමෙන්ම ව්‍යාපෘති කළමණාකරණය තුල සිදුවිය යුතු වර්ධනාත්මක අවශ්‍යතා පෙන්වන්න.				
iii	ව්‍යාපෘති අධීක්ෂණය සඳහා ව්‍යාපෘතිය භාර අමාත්‍යාංශය / ව්‍යාපෘති මෙහෙයුම් ආයතනය විසින් කාර්ය දර්ශක ස්ථාපාත කළ යුතුය. ඊට අනුකූලව සත්‍ය කාර්යසාදනය පරීක්ෂාකර පසුබැසීම් වේනම් වාර්තා කරන්න.				
iv	ඒ ඒ ආයතන විසින් පිළියෙල කරන ප්‍රගති වාර්තා ගිවිසුමේ දක්වා ඇති /ස්ථාපිත/තිබිය යුතු නිර්නායක මත පදනම්ව පිළියෙල කර තිබේද යන්න තහවුරු කර ගන්න.	අදාල විදේශාධාර ගිවිසුම සහ / හෝ ව්‍යාපෘති යෝජනාව නිකුත්කර ඇති උපදෙස් හා මාර්ගෝපදේශ			
v	ව්‍යාපෘති නිමවුම්/නිමවුම් ස්ථාපිත සම්මත ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. ඒ අනුව ව්‍යාපෘති නිමවුම ලඟාකරගෙන තිබේද යන්න තහවුරු කරගන්න.				
vi	උපදේශන කාර්යයෙහි නිරත දේශිය/විදේශිය උපදේශකවරුන් ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් කොන්දෙසි වලට අනුව උපදේශන කාර්යයෙහි නිරත වන්නේද යන්න තහවුරු කර ගන්න.				
vii	ව්‍යාපෘති චක්‍රයේ විවිධ අදියරයන්හිදී ව්‍යාපෘති ඇගයීම් සිදුකර තිබේද යන්න පරීක්ෂා කරන්න.				
viii	ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීම හා සමාලෝචනය සඳහා ක්‍රමිකව රැස්වේද යන්න පරීක්ෂා කරන්න.				
ix	මුල් පිරිවැය ඇස්තමේන්තුවෙන් සත්‍ය පිරිවැය අපගමනය වේනම් ඊට බලපාන හේතු හා පසුබිම හඳුනාගන්න.				
x	දෙනලද කාලරාමුව තුල ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට නොහැකියැයි නිරීක්ෂණය කරන්නේ නම් එහි පසුබිම හා ඊට බලපාන හේතු හඳුනාගන්න.				
xi	ව්‍යාපෘතියේ මුල් ක්‍රියාකාරී සැලැස්මට යම් සංශෝධනයක් කෙරේ නම් එහි පසුබිම හා ඊට				

[redacted]	බලපාන හේතු හඳුනාගන්න.				
[redacted]	ව්‍යාපෘතියේ මුල් ක්‍රියාකාරී සැලැස්මෙහි හෝ පිරිවැය ඇස්තමේන්තුවෙහි කෙරෙන යම් සංශෝධනයන් ව්‍යාපෘති ගිවිසුමට සහ/හෝ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ මඟ පෙන්වීම් වලට අනුව සිදුවන්නේද යන්න තහවුරු කර ගන්න.				
[redacted]	ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරීත්වයට බාධා කරන්නාවූ මූල්‍ය ප්‍රවාහයේ යම් ප්‍රමාදයක් නිරීක්ෂණය කරන්නේ නම් එහි පසුබිම හා ඊට බලපාන හේතු හඳුනාගන්න.				
15.	*කළමනාකරණ වගවීම*				
[redacted]	ව්‍යාපෘති මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ එක් එක් ආයතනයේ රාජකාරි හා වගකීම් ව්‍යාපෘති ආරම්භක අධියරේදී නිශ්චය කළ යුතු අතර එසේ කර තිබේද යන්න හා ඊට අනුව කටයුතු කරන්නේද යන්න පරීක්ෂා කරන්න.				
[redacted]	ව්‍යාපෘති මෙහෙයුම් ක්‍රියාවලිය තුල මතුව ඇති ගැටළු සම්බන්ධව හෝ අවධානයට ලක්විය යුතු කරුණු සම්බන්ධව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව නිසි අවධානය ලබා දී තිබේද යන්න පරීක්ෂා කරන්න.				
[redacted]	ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකක/ය ගෙන ඇති ක්‍රියාමාර්ගයවල සඵලතාව හා කාර්යක්ෂමතාව පරීක්ෂා කරන්න.				
16	*ව්‍යාපෘති ප්‍රසම්පාදනය*				
[redacted]	ව්‍යපෘති ප්‍රසම්පාදනය සඳහා අනුමත ප්‍රසම්පාදන සැලැස්මක් තිබේද යන්න හා ඒ අනුව කටයුතු කර තිබේද යන්න තහවුරු කර ගන්න.				
[redacted]	ව්‍යාපෘතිය සඳහා හඳුන්වාදී ඇති ප්‍රසම්පාදන ක්‍රමවේදය හඳුනාගෙන ඊට අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කර තිබේද යන්න තහවුරු කර ගන්න.				
17.	*ව්‍යාපෘතියේ තිරසාරබව*				
[redacted]	ව්‍යාපෘතියේ තිරසාර බව සහතික කිරීමට හඳුන්වාදී ඇති යාන්ත්‍රණය හඳුනාගෙන එහි ප්‍රමාණවත්බව හා කාර්යක්ෂමතාව තහවුරුකර ගන්න.				